**ශීර්ෂය 4 - උපරිමාධිකරණ විනිශ්චයකාරවරු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය උපරිමාධිකරණ විනිශ්චයකාරවරු විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 4 - උපරිමාධිකරණ විනිශ්චයකාරවරු 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති, රීතී හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 03 දින රෙජිස්ට්‍රාර් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා උපරිමාධිකරණ විනිශ්චයකාරවරු හි සිදු කරන ලද විගණනයේදී අනාවරණය වු විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.5 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වු පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුවී තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරුවන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | 1. සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම | 2.3 |
| | | 2. අභ්‍යන්තර විගණනයේ වූ අඩුපාඩු | 2.4 |
| 127(1)(ආ) | වියදම් සහ රාජ්‍ය ආදායම් එකතු කිරීම පිළිබඳව ප්‍රමාණවත් තරම් පාලනයකට විධිවිධාන සැලැසෙන ක්‍රමයක් සම්පාදනය කළ යුතුවීම. | මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු. | 2.5 |
| 127(2) | තමාගේ පාලනය යටතේ පවත්නා දෙපාර්තමේන්තුවල එවකට තිබෙන වැය විෂයයන් මෙන්ම අළුතින් හෝ වැඩියෙන් වියදම් කිරීම සඳහා වන යෝජනා සැකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය අතින් අමාත්‍යාංශයේදී තියුණු පරීක්ෂාවකට භාජනය කිරීම. | අභ්‍යන්තර විගණනය | 2.4 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 ප්‍රධාන කාර්යභාරයන්

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය කටයුතු සම්බන්ධ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම.

(ආ) මූලික අයිතිවාසිකම් සම්බන්ධ අධිකරණ බලය

(ඇ) අවසාන අභියාචනාධිකරණ බලය.

(ඈ) උපදේශක අධිකරණ බලය.

(ඉ) මැතිවරණ පෙත්සම් (ජනාධිපතිවරණ) සම්බන්ධ අධිකරණ බලය

(ඊ) කවරම ආකාරයක හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය කිරීම පිළිබඳ අධිකරණ බලය.

(උ) පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් කාරණාවක් පිළිබඳ අධිකරණ බලය.

(ඌ) නීතිඥවරුන් ඇතුලත් කර ගැනීම, බඳවා ගැනීම,අත් හිටුවීම සහ ඉවත් කිරීම.

### 2.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදයේ දැක්වෙන කාල රාමුව තුළ භාණ්ඩ සමීක්ෂණය කර ඒ අනුව වාර්තා වන ඌනතා හා අතිරික්ත සම්බන්ධයෙන් කටයුතු නිම කර වාර්තා සෑම මුදල් වර්ෂයකම මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ආයතනය විසින් චක්‍රලේඛය ප්‍රකාර වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 2.3 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනයඋපයෝජනය කිරිම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ ආයතනය වෙත සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය<br>රු.මිලියන | උපයෝජනය<br>රු.මිලියන | ඉතිරිය<br>රු.මිලියන | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| 2016 | පුනරාවර්තන | 131.0 | 108.6 | 22.4 | 17 |
| | මූලධන | 43.6 | 38.4 | 5.2 | 11.9 |
| | **එකතුව** | **174.6** | **147.0** | **27.6** | **15.8** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2017 | පුනරාවර්තන | 137.2 | 129.5 | 7.7 | 5.6 |
| | මූලධන | 56.3 | 53.3 | 3 | 5.1 |
| | **එකතුව** | **193.5** | **182.8** | **10.7** | **5.5** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) විසර්ජන ගිණුම**

**------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

**-----------------------------------------------------**

වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 0.92 මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි.

**(ii) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

**------------------------------**

වැය විෂයයන් 10 ක් සඳහා එකතුව රු.මිලියන 4.14 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 12.15 පමණක් උපයෝජනය කර තිබුණි. ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15සිට සියයට 95 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**2.4 අභ්‍යන්තර විගණනය**

-----------------------

සමාලෝචිත වර්ෂයේදී උපරිමාධිකරණ විනිශ්චයකාරවරු සඳහා අභ්‍යන්තර විගණනක් සිදු කර නොතිබුණි.

**2.5 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**2.5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

**------------------------------------------------------------------------------------------**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 23 ක්, තථ්‍ය සේවක සංඛ්‍යාව 22 ක් හා පුරප්පාඩු සංඛ්‍යාව 01 ක් වූ අතර 2018 ඔක්තෝබර් 17 දිනට කාර්ය මණ්ඩලය පුරප්පාඩු සංඛ්‍යාව 02 ක් විය.සමාලෝචිත වර්ෂය වෙනුවෙන් උපරිමාධිකරණ විනිශ්චයකාරවරු (ශීර්ෂ අංක 04 න්) විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 87.49 ක් වැය කර තිබුණි.